# LEARNING RECOVERY PLAN

**විෂය** Subject - පෙරදිග සංගීතය

**ශ්‍රේණිය** Grade - 6

**කාලච්ඡේද** Periods - 60

| | **නිපුණතාවය** Competency | **ක්‍රියාකරකම** Activity | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල** Essential Learning Outcomes | **විෂය අන්තර්ගතය** Subject Content | **කාලච්ඡේද** Periods |
|---|---|---|---|---|---|
| 6 ශ්‍රේණිය | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 01 | • දීර්ඝ හුස්මක් රඳවා ගෙන ගැයීමට හුරු වෙයි.<br>• භාවාත්මක ව ගැයීමට අවශ්‍ය මූලික ශක්තිය ලබා ගනියි | ස්වසන අභ්‍යාස | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 02 | • නාද සහ ශබ්ද අතර වනස දක්වයි.<br>• පෙරදිග අපරදිග ස්වර නාම සහ සංකේත සන්සන්දනය කරයි.<br>• ස්ථානීය අගයෙන් යුක්තව, ස්වර ගායනයට පෙළඹෙයි. | ස්වර නාම සහ ස්වර සංකේත | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 03 | • පෙරදිග සහ අපරදිග වශයෙන් සංගීත ක්‍රම දෙකක් ඇති බව වටහා ගනියි. | පෙරදිග අපරදිග වශයෙන් සංගීතයේ ස්වභාවය | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 04 | • ශුද්ධ ස්වර ගායන කුසලතාව ලබයි.<br>• ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයයි.<br>• ශුද්ධ ස්වර අන්තර වටහා ගනියි.<br>• ස්වර අභ්‍යාස තුළින් ස්වර ස්ථාපන ගී නිර්මාණය වී ඇති බව පිළිගනී.<br>• ස්වර අභ්‍යාස ගොඩනැගීමට පෙළඹෙයි.<br>• ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි. | ස්වර ස්ථාපන ගීත ගායනය (නිර්දේශිත ගීත 02) | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 05 | • පහසුවෙන් පරිහරණය කළ හැකි සංගීත භාණ්ඩ හඳුනාගනී.<br>• එම භාණ්ඩයන්හි ස්වර පිහිටන ආකාරය වටහාගනියි.<br>• එම භාණ්ඩයන්හි ස්වර සප්තකය හා සරල තනුවක් වැයීමට හැකියාව ලබාගනී.<br>• මෙම භාණ්ඩ වාදනයේ ඇති පහසුතා වටහාගනී.<br>• මෙම භාණ්ඩ වාදනය තුළින් සම්භාව්‍ය සංගීත භාණ්ඩ වාදනයේ ඇල්මක් ඇති කරගනී.<br>• ක්‍රීඩාමය අත්දැකීමක් ලෙසින් භාණ්ඩ වාදනයේහුරුව ලබයි. | සංගීත භාණ්ඩ වාදනය කරමු | 03 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 06 | • තාලානුකූල ස්වර අභ්‍යාස වාදනයේ යෙදෙයි.<br>• තෝරාගත් භාණ්ඩයෙන් නිවැරදි ස්වර වාදන හැකියාව ලබයි.<br>• ස්වර අභ්‍යාසයේ යෙදීම, වාදන කුසලතා වර්ධනයේ දී වැදගත් වන බව පිළිගනී. | සරල සංගීත භාණ්ඩවලින් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 07 | • තෝරාගත් වාද්‍ය භාණ්ඩය පිළිබඳ ව සරල අවබෝධයක් ලබයි.<br>• අනෙකුත් වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව හැඳිනගැනීමට ඇල්මක් දක්වයි. | සංගීත භාණ්ඩ හඳුනාගැනීම | 02 |
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 08 | • ළමා ගී ගායන/වාදන කිරීමේ කුසලතාව ලබයි.<br>• ළමා ගී රස විඳියි.<br>• ළමා ගී නිර්මාණය කිරීමට පෙළඹෙයි.<br>• ළමා ගී ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි.<br>• ළමා ගී පදමාලා තුළ ඇති ස්වභාවය හා සුවිශේෂත්වය පිළිබඳ අවබෝධය ලබාගනී. | ගයා වයා විඳිමු ළමා ගී | 02 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 09 | • පාසල් ගීතය ගායනය /වාදනය වන විට සීරුවෙන් සිට ගායනය කරයි.<br>• තම පාසල් මාතාවට ගෞරවය දක්වයි.<br>• පාසලේ අනන්‍යතාව පාසල් ගීතයෙන් පිළිබිඹු වන බව අවබෝධ කර ගනියි.<br>• පාසලේ ඓතිහාසික තොරතුරු සොයා බැලීමට පෙළඹෙයි. | පාසල් ගීතය ගැයීම /වැයීම | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 10 | • ජාතික ගීය ගැයෙන, ඇසෙන ස්ථානයක භාවිත කළ යුතු ඉරියව් අනුගමනය කරයි.<br>• තමා උපන් දේශයට ගෞරවය, ප්‍රණාමය දක්වයි.<br>• රටක, ජාතියක අනන්‍යතාව ජාතික ගීය තුළින් පිළිබිඹු වන බව අවබෝධ කර ගනියි. | ජාතික ගීතය ගැයීම /වැයීම | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 11 | • නූර්ති ගීත ප්‍රචලිත වූ කාල වකවානුව දැනගනියි.<br>• අද්‍යතන යුගයේ ජනප්‍රිය නූර්ති ගීත නම් කරයි.<br>• නූර්ති ගීත ගායනයට කැමැත්ත පළකරයි.<br>• නූර්ති ගීත ඇතුළත් නාට්‍යවල නම් ලියයි.<br>• නූර්ති ගීත මිහිරි ව ගායනය කරයි. | නූර්ති ගීත ගායනය කරමු | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 13 | • ස්වර අභ්‍යාසවල ස්වභාවය පැහැදිලි කරයි.<br>• ස්වර අභ්‍යාස නිර්මාණය කරයි.<br>• ශුද්ධ ස්වර සහිත ස්වර අභ්‍යාස ගායනයේ යෙදෙයි.<br>• ආධුනිකයකු ස්වර අභ්‍යාසයේ යෙදීමේ වැදගත්කම පිළිගනියි. | තාලානුකූල ස්වර අභ්‍යාස ගායනය | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 15 | • එක් එක් සංගීත භාණ්ඩවල වාදන ඉරියව් පිළිබඳ විස්තර කරයි.<br>• නිවැරදි ඉරියව් භාවිතය සංගීත භාණ්ඩවල වාදන කුසලතාව ඇති කිරීමට බලපාන බව ප්‍රකාශ කරයි.<br>• විවිධ සංගීත භාණ්ඩ නිවැරදි ඉරියව් අනුව පරිහරණය කරයි. | තෝරාගත් සම්භාව්‍ය වාද්‍ය භාණ්ඩ වාදන ඉරියව් | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 16 | • වයලින්, එස්රාජ්, දිල්රුබා යන සංගීත භාණ්ඩවල බෝව හසුරුවන ආකාරය පෙන්වයි.<br>• සිතාර්, ගිටාර්, මැණ්ඩලීන් යන සංගීත භාණ්ඩවල මිස්රාබ් එක, පික් එක හසුරුවන ආකාරය පෙන්වයි.<br>• බටනලාවේ නාදය උපදවන අයුරු පිඹීමේ අභ්‍යාස මගින් දක්වයි.<br>• තබ්ලාවේ බායාවේ හා දායාවේ මූලික අක්ෂර උපදවයි. | ස්වර ස්ථාන නිවැරදි ව වාදනය සඳහා සංගීත භාණ්ඩවල මූලික අභ්‍යාස | 03 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 18 | • සංගීත භාණ්ඩවල නාදමය ගුණය පිළිබඳ අදහස් දක්වයි.<br>• වාදක මණ්ඩලයක ස්වරූපය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි | සංගීත භාණ්ඩයකින් ස්වර ස්ථාපන ගීතයක් වාදනය කිරීම | 04 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 19 | • සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.<br>• එළුවන් කැමේ ගීත ගායනය කරයි.<br>• රංගනයේ යෙදෙමින් රසාස්වාදයේ යෙදෙයි.<br>• එළුවන් කැමේ ක්‍රීඩාවේ ස්වභාවය විස්තර කරයි. | කළි ගීත (එළුවන් කෑම) | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 20 | • සාමූහිකත්වය වර්ධනය කරන ගීත විශේෂයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.<br>• මේවර කෙළියේ ගීත ගායනා කරයි.<br>• රංගනයේ යෙදෙමින් රසාස්වාදයේ යෙදෙයි.<br>• ගැමි පරිසරය, ගැමි ජීවන රටාව මෙම ගීත තුළින් විචිත්‍රවත්ව මැවීපෙනෙන බව ප්‍රකාශ කරයි.<br>• මේවර කෙළියේ ස්වභාවය විස්තර කරයි. | කෙළි ගීත (මේවර කෙළිය) | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 21 | • ඔළිඳ කෙළිය ගීතවල නාද රටාව ගැන අදහස් දක්වයි.<br>• කෙළි ගී නාද මාලා එකිනෙකට සුළු වෙනස්කම් පෙන්වන බව ප්‍රකාශ කරයි.<br>• ඔළිඳ කෙළිය ගීත නාද රටා, සහ ක්‍රීඩාව පිළිබඳ අදහස් දක්වයි. | කෙළි ගීත (ඔළිඳ කෙළිය) | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 22 | • කළගෙඩි සෙල්ලමේ ගීතවල නාද රටාව හා පදමාලාව පිළිබඳ අදහස් දක්වයි.<br>• දේශීය ජනක්‍රීඩා ආශ්‍රිත කෙළි ගී නාදමාලා එකිනෙකට සුළු වශයෙන් වෙනස්කම් පෙන්වන බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රීතියෙන්, රංගනයෙහි, ගායනයෙහි සාමූහික ජන නැටුමක් බව පිළිගනියි.<br>• උචිත රංග රටා ඇසුරින් ස්වයං නිර්මාණ ඉදිරිපත් කරමින් නර්තනයේ යෙදෙයි.<br>• මෙම ගී ඇසුරින් කරන ලද සරල ගී අගය කරයි. | කළගෙඩි සෙල්ලම ගීත ගායනය කරමින් රංගනය කරමු | 01 |
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 23 | • මව්පිය ගුණ ඇතුළත් ළමා ගී පදමාලා තුළ ඇති අන්තර්ගතය වටහා ගනියි.<br>• ළමා ගී ඇතුළත් ගී ගායනය /වාදන කිරීමේ කුසලතාව ලබයි.<br>• මව්පිය ගුණ වරුණ ඇතුළත් පදමාලා නිර්මාණය කිරීමට පෙළඹෙයි.<br>• මව්පිය ගුණ වරුණ ඇතුළත් ගී ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි.<br>• ලය නිවැරදි ව පවත්වා ගැනීමේ කුසලතාව ලබා ගනියි. | ගයා වයා විඳිමු ළමා ගී | 02 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 24 | • තුන් සරණේ ගීත ගායනය තුළ අවස්ථා පැහැදිලි කරයි.<br>• තුණ් සරණේ ගීත ගායනා කරයි.<br>• තුණ් සරණේ ගීත ගායනය තුළින් අධ්‍යාත්මික සුවයක් ලබයි. | තුන් සරණේ ගීත | 02 |
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 25 | • නාට්‍ය ගීත ගායනය කිරීමේ කුසලතාව ලබයි.<br>• නාට්‍ය ගීත ගයමින් රස විඳියි.<br>• නරි බැණා නාට්‍යය පිළිබඳ අදහස් දක්වයි.<br>• ප්‍රාසංගිකව ගීත ගායනයට ඇල්මක් දක්වයි. | නරිබැණා නාට්‍යයේ ගීත ගායනය කරමු | 02 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 27 | • රිජිෆෝම්, ගම් කුප්පි, විවිධ ඇට වර්ග ප්ලාස්ටික් බෝතල්, කළගෙඩි ක්ලැපර්ස්, මර්කාස්,<br>• රිද්ම රටා ප්‍රස්තාර කරන ලද දෘශ්‍ය පත්‍රිකාවක්<br>• මේස හැඳි, හොඳින් මේරූ වේලා ගත් ඉරටු මිටි, ටොනික් මූඩි, උණබම්බු කැබලි.<br>• සංගීත භාණ්ඩ | ඇතිල්ලීමෙන්, පෙළීමෙන්, පිඹීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 28 | • සංගීත භාණ්ඩයක් ආධාරයෙන් ස්වර සුසර කරයි.<br>• සිහින් ලී කෝටු 2 ක් මගින් එම ස්වර විවිධ රටාවනට හඬ නංවයි.<br>• ස්වර තුන අතර පරතරය වටහා ගනියි.<br>• විවිධ රිද්ම රටා හා තනු කොටස් වයමින් රසාස්වාදයේ යෙදෙයි.<br>• ආදේශ භාණ්ඩ නිර්මාණයට පෙළඹෙයි. | ගැටීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ | 02 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 29 | • ස්වර හතක් දක්වා වීදුරු භාණ්ඩය වර්ධනය කරයි<br>• ලියන ලද ස්වර ප්‍රස්තාර කියවා බලා වාදනය කරයි.<br>• නිර්මාණය කර ඇති වාද්‍ය භාණ්ඩ හා මාතෘකාව අතර ගැලපීම විමසයි.<br>• නව සංගීත බණ්ඩ නිර්මාණය කිරීමට පෙළඹෙයි.<br>• සමූහය සමග වයමින් රස විඳියි. | ආදේශ භාණ්ඩ හා නිශ්චිත සංගීත භාණ්ඩ එකතුව මාතෘකාවකට අදාළ ව නිර්මාණයේ යෙදීම. (වැස්ස, කෝච්චිය) | 04 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 30 | • ප්‍රචලිත රබන් පද ඉදිරිපත් කරයි.<br>• විවිධ රටාවලට බැඳී ඇති රබන් පද වර්ග කරයි.<br>• රබන් පද ආශ්‍රිත ව ගීත නිර්මාණය වී ඇති බව වටහා ගනී.<br>• ආදේශ භාණ්ඩ මගින් රබන් පද වාදනයට පෙළඹෙයි.<br>• අලුතින් රබන් පද නිර්මාණය කරයි.<br>• සමූහය සමග රබන් පද වයමින් රසාස්වාදයේ යෙදෙයි. | රබන් පද වාදනය | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 31 | • රිද්මය විවිධ රටාවන් සහිත බව ප්‍රකාශ කරයි.<br>• මාත්‍රා 2, 3, 4 ආදී වශයෙන් බෙදෙන බව පවසයි.<br>• නැවතීම් හා ඇදීම් අනුව විවිධ රටා බිහිවන බව පිළිගනියි.<br>• විවිධ රිද්ම රටා නිර්මාණය කරයි.<br>• රිද්ම රටා අනුව අත්තැළීම හෝ භාණ්ඩයකට තට්ටු කිරීම කරයි | රිද්ම රටා ප්‍රස්තාර කිරීම | 02 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 17 | • මාත්‍රා යනු කුමක්දැයි අර්ථ දක්වයි.<br>• ලඝු, ගුරු, ප්ලුත අක්ෂර නම් කරයි.<br>• ගී පාදයක ලඝු, ගුරු අක්ෂර සඳහා වන සංකේත ලකුණු කරයි.<br>• ලඝු, ගුරු, ප්ලුත අක්ෂර වෙන් කොට හඳුනාගනියි. | මාත්‍රා, ලඝු, ගුරු, ප්ලුත අක්ෂර විභාග | 03 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 33 | • මූලික මත් සන තුන සහිත ගී පද ප්‍රස්තාර කරයි.<br>• මාත්‍රා සංඛ්‍යාව අනුව ඇදෙන ප්‍රමාණය සංකේත මගින් දක්වයි.<br>• පද සහ ස්වර අතර සබඳතාවය හඳුනාගනියි.<br>• ශ්‍රවණය කළ ගී පාදයක් පද ප්‍රස්තාර කරයි. | මූලික තාල මත පද ප්‍රස්තාර කිරීම | 02 |
| | **කාලච්ඡේද එකතුව** | | | | **60** |